# ගොවිතැනටත කොම්පියුටර්

වසර විස්සකට පෙරදී 'මිනිස් වර්ගයා සඳ තරණය කරනු ඇතැයි' යන්න හුදු සිහිනයක් විය. එහෙත් 1969 ජූලි මාසයේදී එය සත්‍ය ක්‍රියාවලියක් බවට පත්විය.

එලෙසින්ම, නවීන විද්‍යාඥයින්ගේ මතය අනුව කාර්මික විප්ලවයට පෙර, සියවසක් තුළ සොයා ගන්නා ලද සියල්ලට වැඩි නව නිෂ්පාදනයන්, නූතන ලෝකයේ වසර කිපයක් තුළ දී සොයා ගැනීමට තරම් අද විද්‍යාව දියුණුය. ජන ජීවිතයට, සංස්කෘතියට, කලාවට, මිනිස් ආකල්ප වලට මෙන්ම කෘෂි කර්මයටද විද්‍යාව අතිශයින් බලපානු ඇත. විද්‍යාවේ දියුණුව මත පරිසරය පාලනය කර ගැනීමේ මිනිස් හැකියාව, බලාපොරොත්තු නොවූ ආකාරයෙන් ඉහළ ගොස් ඇත. කෘතිම වර්ෂාවන්, සුළං වලට ඔරොත්තු දෙන භෝග, කෙටිකාලීන වැඩි අස්වනු දෙන බෝගවර්ග, කෘෂිරසායනික ද්‍රව්‍ය යනාදිය තව දුරටත් ශ්‍රී ලංකාවේ ගොවීන්ට සිහිනයක් නොවන බව අපි දනිමු.

විප්ලවයෙන් බිහිවූ කාර්මික යුගය මෙන්ම විදුලි යුගයද පසුකර, අද ලෝකය පැමිණ ඇත්තේ විද්‍යුත් යුගයටයි. බරපතල කාර්මික උපකරණ භාවිතයේ සිට සැහැල්ලු විද්‍යුත් උපකරණ නිර්මාණය වීම සඳහා ගතවූයේ ඉතාම සුළු කාලයකි.

විද්‍යුත් උපකරණ අතරවූ අසිරිමත් නිමවුම වන, කොට්පියුටරයේ (පරිගණක යන්ත්‍රයේ) සේවය, අද ශ්‍රී ලංකාවේ නොයෙකුත් අංශ මගින් ලබාගනී. මෙහි මුල් අවධියේදී, ගණිත කර්ම සඳහා වැඩි අවධානයක් යොමු වුවද, වැඩි කල් යැමට මත්තෙන්, ගොවියාගේ වහලෙක් ලෙස පරිගණන යන්ත්‍ර භාවිතා නොකරනු ඇතැයි කිවහැකි කාටද?

මූලික වශයෙන්, විවිධ සමීක්ෂණ වලදී සොයා ගන්නා දත්තයන් විශ්ලේෂණය, කඩිනම් කිරීම සඳහා කොම්පියුටර් යොදා ගැනීම මගින් ජාතික හා ප්‍රාදේශීය වශයෙන් සංවර්ධනයට අවශ්‍ය නිර්දේශ කඩිනමින් ලබා දීමට පර්යේෂකයින්ට හැකිවේ. එවිට ප්‍රතිපත්ති සම්පාදකයින්ටද ඒ අනුව කටයුතු කිරීමෙන් සංවර්ධනය වේගවත් කරගත හැකිය.

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ විමර්ෂක

**ලලිත් ජයසූරිය විසිනි**

තව පැත්තකින්, කෘෂි අස්වැන්න දියුණුවට හේතුවන පරිදි, නව දෙමුහුන් බෝග නිෂ්පාදනයට කොම්පියුටරය යොදා ගත හැකිය. මූලික වශයෙන් දෙමුහුන් බෝග වර්ගයන් නිෂ්පාදනයේදී අස්වැන්නට බලපාන විවිධ සාධකයන්ගේ සංකලන රටා පිළිබඳව පර්යේෂණ කරනු ලැබේ. මෙහිදී වී වර්ග දෙකක් කවර ප්‍රතිශත මත මිශ්‍ර කළොත් වැඩි අස්වනු ලැබේද? ඊට අවශ්‍ය පෝර වර්ග මොනවාද? යනාදිය පිළිබඳව තීරණගත හැකි වනුයේ ප්‍රායෝගිකවම එවැනි වර්ග බිහිකර වර්ෂ කීපයක් අත්හද බැලීමෙන් පසුවයි.

නමුත් කොම්පියුටරයක් මගින් මෙවැනි සංකලනයන් මගින් බිහිවෙන නව බෝග වර්ග වල ගති ලක්ෂණ කලින් උපකල්පනය කර ගත හැකි නිසා ඒ මගින්, නව බෝග වර්ග ඉක්මනින් බිහිකිරීමටත්, එයින් ජාතික නිෂ්පාදනයට බලපෑම් ඇතිකිරීමටත් හැකිවේ.

දෙමුහුන් සතුන් නිෂ්පාදනයේදීද මෙවැනිම ක්‍රම අනුගමනය කිරීමට හැකි අතර දැනටමත් බොහෝ රටවල් මේ සම්බන්ධව පරිගණක යන්ත්‍ර භාවිතා කරනු ලැබේ.

අනෙක් අතට, වඩා නිවැරදි කාලගුණ අනාවැකි දක්වීමට හැකියාවක් ඇත්නම් එය ගොවිතැනට මහඟු පිළිසරණක් වන බව කිව යුතු නොවේ. විද්‍යාඥයින් පවසන ආකාරයට දැනට නිවැරදි කාලගුණ තොරතුරු පැවැසීමට මූලික බාධාවක් වනුයේ කලින් කල ඇතිවන භූමිකම්පා, යමහල්, සුළිසුළං ආදිය නිසා දේශගුණ චක්‍රයේ ඇතිවන හදිසි වෙනස්වීම්ය. නමුත් කොම්පියුරටයක් මගින් මෙ අනාවැකි වඩා නිවැරදිව කීමට හැකි බැවින් එයින් ගොවීන්ට හා ධීවරයින්ට විශාල මෙහෙයන් ඉටුකළ හැකිවේ. තවත් අතකින්, ආහාර ද්‍රව්‍ය මිල රටාව පිළිබඳ නිවැරදි තොරතුරු ලබාගැනීමට නොහැකිවීම නිසා ගොවීන්ගේ අස්වනු අඩු මිලට අලෙවි කිරීමට හෝ විනාශ වීම මෙන්ම පාරිභෝගිකයින්ට නිසි පරිදි, ඒවා මිලට ගැනීමට නොහැකි අවස්ථා උදාවීමද, ශ්‍රී ලංකාවේ සුලභ සිද්ධියකි.

සමහර අවස්ථා වලදී, රතුලූනු, මිරිස් වැනි ද්‍රව්‍ය හිඟයක් පවතින බව දැන ගන්නට ලැබෙන්නේ, හිඟය ආරම්භ වීමෙන් පසුවය. එවිට, ඒවා ආනයනය කිරීම සඳහා අවශ්‍ය කල් මදවේ. සමහර විටදී, ආනයනය කරන ද්‍රව්‍ය ලැබෙන්නේ ඊළඟ අස්වනු නෙලන වාරය ඇරඹුනු විටය. එවිට ගොවි ද්‍රව්‍ය වලට අඩු මිලක් ලැබීම මෙන්ම ජාතික ධනය විනාශ වීමද සිදුවේ. මේ නිසා, මෙවැනි ද්‍රව්‍යයන්ගේ මිල රටාව පිළිබඳව, පාරිභෝජනය පිළිබඳව, පරිගණක යන්ත්‍ර උපයෝගී කර ගෙන කරනු ලබන පර්යේෂණද අනාගතයේදී, ශ්‍රී ලංකාවේ ජන ජීවිතයට වඩා සුභදායක අයුරින් බලපානු ඇත.